# සීමාසහිත ලංකා පොහොර සමාගම

(කෘෂිකර්ම අමාත්‍යාංශය)

வரையறுக்கப்பட்ட இலங்கை உரக் கம்பனி

(விவசாய அமைச்சு)

# CEYLON FERTILIZER CO. LTD

(Ministry of Agriculture)


යොමු අංකය CFC/CHM/FI/02

2015 දෙසැම්බර් මස 11 දින.

පී.එස්.කේ. ජයකොඩි මහතා.
හිටපු කළමණාකරු (ප්‍රසම්පාදන හා ආනයන)
සී/ස ලංකා පොහොර සමාගම,

## චෝදනා පත්‍රය

ඔබ සීමාසහිත ලංකා පොහොර සමාගමෙ කළමණාකරු (ප්‍රසම්පාදන) වශයෙන් රාජකාරි කරමින් සිටියදී ආයතන සංග්‍රහයේ දෙ වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනය යටතට ගැනෙන පහත සඳහන් චෝදනාවන්හි අඩංගු වන රාජකාරිපැහැර හැරීම් හා/හෝ විෂමාචාරයන්හි යෙදීම යන වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ සිදුකිරීම හේතුකොට ගෙන හා/හෝ සිදුකිරී[illegible]මෙන් සහ අනාවරණය කර නොගැනීමෙන් බරපතල වරදක් සිදුකර ඇත. ඒ සම්බන්ධයෙන් ඔබ සේවයෙන් පහ නොකිරීමට හෝ වෙනත් අයුරකින් දඬුවම නොපැමිණවීමට හෝ හේතු ඇතොත්, මෙම ලේඛණය ලැබී දින 14 ක් ඇතුලත මා වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට මෙයින් ඔබට නියෝග කරමි.

01. සීමාසහිත ලංකා පොහොර සමාගම, හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණ භූමි පරිශ්‍රයේ කාපට් ඇතිරීම සම්බන්ධ කොන්ත්‍රාත්තුවට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටු කිරීමේ දී ඉදිකිරීම් පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනයේ ICTAD/SBD/01 – Volume 01 වැඩ ප්‍රසම්පාදන ලේඛණයේ 03 වන කොටසේ කොන්ත්‍රාත් කොන්දේසි යටතේ ඇති අංක 51.1 වගන්තිය හා අත්තිකාරම ගෙවීම් ඇපකර ආකෘතියේ සඳහන් ප්‍රකාරව ක්‍රියා නොකිරීමෙන් සමාගමට රුපියල් අසූඅටලක්ෂ පනස්නවදහස් හත්සිය අටක (88,59,708/-) හෝ ඊට ආසන්න මුදලක් අහිමි වන අයුරින් කටයුතු කරමින් සමාගමට පාඩුවක්/අලාභයක් සිදු වන පරිදි හා/හෝ සිදුවීමට ඉඩ තබමින් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් අනවධානයෙන් කටයුතු කිරීම.


ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, වත්තල.
லக்பொஹொர ஸ்வர்ண ஜயந்தி மாவத்தை, ஹுனுப்பிட்டிய, வத்தளை. Lakpohora Swarna Jayanthi Mawatha, Hunupitiya, Wattala, Sri Lanka.
Telephone: 2930298, 2930299. E-mail: info@lakpohora.lk Web Site: www.lakpohora.lk FB: www.facebook.com/Lakpohora LK

Chairman: Tel. 2947764 Fax: 2947763, E-mail: chairman@lakpohora.lk Working Directors: Tel. 3037381, E-mail: wd@lakpohora.lk Tel. 2947799 E-mail: wdm@lakpohora.lk General Manager: Tel. 2948831 Fax: 2948831, E-mail: gm@lakpohora.lk Manager (Finance): Tel. 2947761 Fax: 2947761, E-mail: fm@lakpohora.lk Manager (Administration & Human Resources) Tel. 2948555, Fax: 2948555, E-mail: hrm@lakpohora.lk Manager (Procurement & Imports): Tel. 2947765 Fax: 2930423, E-mail: pm@lakpohora.lk Manager (Marketing & Sales): Tel. 2944040 Fax: 2947760/2, E-mail: mm@lakpohora.lk Manager (Distribution): Tel. 2930381, Fax: 2930403, E-mail: dm@lakpohora.lk Chief Internal Auditor: Tel. 2948558, [illegible]

(ආ) ලිපිලේඛන

1. 2014.01.23 දින හා අංක 2013/CFC/AS/ST/01දිනැති කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය,
2. ඉදිරිපත් කළ ටෙන්ඩරය අනුව ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුව භාරගත් බව දන්වා සමාගම වෙත 2014.02.05 දින කොන්ත්‍රාත් අයකනය එවූ ලිපිය.
3. 2014.02.06 දින හා යොමුව Man./Loan/Menu දරණ යක්කල, මහජන බැංකුව නිකුත් කළ අංක 06/2014 දරණ ඇපකර ලිපිය.
4. 2014 පෙබරවාරි මස 18 දින ශ්‍රී/ස ලංකා පොහොර සමාගම සහ ඩී. එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනයේ අදාල නිලධාරීන් සමග අත්සන් කළ ගිවිසුම හා කොන්ත්‍රාත් දත්ත ඇතුලත් ලේඛණ පිටු 08යි.
5. ශ්‍රී/ස ලංකා පොහොර සමාගම විසින් කොන්ත්‍රාත්කරු වෙත රු.88,59,708/-ක අත්තිකාරම් මුදලක් 2014.02.21 හෝ ආසන්න දිනක ගෙවීම සඳහා යොදා ගත් අසම්පූර්ණ කාර්යය ඇණවුම. (Purchase Order)
6. 2014.02.17 දින යක්කල, සම්පත් බැංකුව නිකුත් කළ අංක 306851300046 දරණ අත්තිකාරම් ගෙවීම් ඇපකරය,
7. 2014.03.12 දින අංක CFC/TEC/PROJECT/FI/24 දරණ ශ්‍රී/ස ලංකා පොහොර සමාගම විසින් ඩී. එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනය වෙත යවන ලද ලිපිය,
8. 2014.03.26 දින අංක CFC/TEC/PROJECT/FI/24 දරණ ශ්‍රී/ස ලංකා පොහොර සමාගම විසින් ඩී. එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනය වෙත යවන ලද ලිපිය,
9. 2014.03.22,27,31 දින හා 2014.04.01,08,18 සහ 2014.05.05 දින එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනය සමාගමට එවන ලද ලිපි හත (07),
10. 2014.03.31 දින ශ්‍රී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණ භූමි පරිශ්‍රයේ කාපට් ඇතිරීම සම්බන්ධ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පැවති රැස්වීම් වාර්තාව,
11. 2015.04.10 ප්‍රධාන අභ්‍යන්තර විගණක ගේ විමර්ශන වාර්තාව හා අදාල ප්‍රකාශයන්.
12. මෙ හා සම්බන්ධ සමාගමේ අදාල ලිපිගොනු අවශ්‍ය පරිදි ඉදිරිපත් කරනු ඇත.

03. ඉහත 02 (ආ) හි දැක්වෙන ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඔබට හා/හෝ ඔබගේ රැකවරණ නියෝජිතයෙකුට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නියම කරනු ලබන දිනයකදී ඒවා පරීක්ෂාකර බලා ඔබට අවශ්‍යවන ලිපිලේඛන වල ඡායා පිටපත් මගේ පූර්ව අනුමැතිය මත නියමිත මුදලක් ගෙවා ලබාගත හැකි ය.

04. ඔබ වෙනුවෙන් පෙනී සිටීමට රැකවරණ නිලධරයෙක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන්නේ නම් ඒ සඳහා ඔහු දරණ (විශ්‍රාමිකයෙකු නම් දැරූ) තනතුර සහ රාජකාරි/පෞද්ගලික ලිපිනය සඳහන් කරමින් ඔහු ඔබගේ රැකවරණ නිලධාරියා වශයෙන් පෙනී සිටීමට කැමැති බවට ලිපියක් සමග යොමුකර මගේ පූර්ව එකඟත්වය ලබාගත යුතුය. ඔබගේ රැකවරණ නිලධරයා සමාගමේ හෝ රජයේ නිලධරයකු හෝ සේවයෙන් විශ්‍රාම ලැබුවකු හෝ සංස්ථා සේවයේ නියුතු/විශ්‍රාමික නිලධාරියෙකු විය යුතු ය.

02. ඉහත පළමුවන චෝදනාවේ සඳහන් කොන්ත්‍රාත්තුවේ කාලසීමාව දීර්ඝ කිරීම හෝ එසේ දීර්ඝ කිරීම මත අත්තිකාරම ගෙවීම බැංකු ඇපකරයේ වලංගු කාලසීමාව දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු ඩී. එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනය වෙතින් ඉල්ලීමක් කිරීම හා/හෝ ඒ සඳහා උපදෙස් දීමක්/නියෝග දීමක්, පියවර නොගැනීමෙන් හා තම උසස්/යටත් නිලධාරීන් යොමු නොකර සමාගමට අහිතකර අන්දමට කටයුතු කිරීම.

03. ඉහත පළමු හා දෙවන චෝදනා වල සඳහන් පරිදි ක්‍රියා කරමින් වැඩ ප්‍රසම්පාදන ලේඛනයේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත් වටිනාකමින් 5%ක් වටිනා කාර්යසාධන ඇප බැඳුම්කරය කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපේක්ෂිත දිනයේ සිට දින 28ක ඉදිරි කාලසීමාවකට වලංගු වන පරිදි ලබා නොගැනීමෙන් හා/හෝ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට නිලධාරීන් යොමු නොකිරීමෙන් තම වගකීම හා රාජකාරි පැහැර හැරීම.

04. යක්කල මහජන බැංකු ශාඛාවෙන් 2014.02.06 දින සිට 2014.05.05 දින තෙක් කාල සීමාවට අදාල අංක 06/2014 දරණ රුපියල් විසිදෙලක්ෂ දාහතරදහස් නවසිය විසිහතක් (22,14,927/-) වටිනා කාර්ය සාධන ඇපකරය, කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනය වූ 2014.05.10 දිනට පෙර කල්ඉකුත් වන බව සැලකිල්ලට ගෙන කටයුතු නොකිරීමෙන් හා/හෝ කටයුතු කිරීමට උපදෙස් දෙමින් අවශ්‍ය විධිවිධාන නොයොදා අවධානයෙන් හා/හෝ නොසැලකිල්ලෙන් කටයුතු කිරීම.

05. ඉහත අංක 01 සිට 04 දක්වා චෝදනාවෙන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලෙහිම සඳහන් විෂමාචාරයන්, රාජකාරි පැහැර හැරීම් හා/හෝ වරදවල් සිදු කිරීමෙන් ඔබගේ රාජකාරියත්, ඔබ දරණ තනතුරත් අපකීර්තියට පත් කිරීම හා සේවක විනය ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන්ට පටහැනි අයුරින් සීමාසහිත ලංකා පොහොර සමාගමේ සේවය කරමින් ක්‍රියා කිරීම.

02. (අ) සාක්ෂිකරුවන්

1. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.
2. කළමණාකාර අධ්‍යක්ෂ, කොන්ත්‍රාත්කරු ඩී. එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනය, අංක 123/ඒ, නුවර පාර, යක්කල.
3. කළමණාකරු හෝ ඔහුගේ නියෝජිතයෙක්, මහජන බැංකුව, යක්කල.
4. කළමණාකරු හෝ ඔහුගේ නියෝජිතයෙක්, සම්පත් බැංකුව, යක්කල.
5. කළමණාකරු (මුදල්), සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.
6. එස්.ඒ.ආර්.පී.පී. පෙරේරා මහතා, සහකාර ගණකාධිකාරී, සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.
7. ඩබලිව්.ඩී. ඩයස් සහත්මිය, ප්‍රසම්පාදන විධායක, සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.
8. ජී.ජී. සමන් මහතා, සහකාර කළමණාකරු (ප්‍රසම්පාදන), සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.
9. ඩී.එම්.එන්.ඒ. දිසානායක, කළමණාකරු (කාර්මික), සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.
10. ඊ.පී.ජේ. ප්‍රනාන්දු මහතා, ප්‍රසම්පාදන විධායක, සී/ස ලංකා පොහොර සමාගම, හුණුපිටිය, වත්තල.

05. ආයතන සංග්‍රහයේ දෙ වන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 15:7 හා 15:8 යන උප වගන්ති අනුව පිළිතුරු සැපයීමට ඔබට පුළුවන. චෝදනා සම්බන්ධයෙන් ඔබ නිවැරදිකරු බව පවසා, ඔබගේ නිදොස් බව සනාථ කිරීමට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටින්නේ නම්, ආයතන සංග්‍රහයේ දෙ වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 19 වගන්තියේ දැක්වෙන පරිදි ඒ සඳහා පරීක්ෂණ නිලධාරියෙකු මා විසින් පත්කරනු ඇත.

06. ඔබගේ පිළිතුරු නියමිත කාලසීමාව තුළ දී මා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔබගේ නිදහසට ඉදිරිපත් කිරීමට කරුණු නොමැති සේ සලකා ක්‍රියා කරන්නෙමි.

05. කරුණාකර, මෙම චෝදනා පත්‍රය ලැබුණු බවට මා වෙත දන්වා එවන්න.

[illegible]
සහකාර ප්‍රධාන විධායක නිලධාරී.

මෙම චෝදනා පත්‍රය භාරගත් බවට මෙම අනුපිටපතෙහි අත්සන් කර මා වෙත ලබාදී[redacted]න.

දිනය :.....................

අත්සන .................................
(චෝදනා ලත් නිලධාරී)

පත්‍රිකා අංක:264/19/13, 265/19/18, 266/19/09
2019 / මානව සම්පත් අංශය

## අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව.

| | | |
|---|---|---|
| වෙත | : | අධ්‍යක්ෂ මණ්ඩලය |
| වෙතින් | : | මානව සම්පත් අංශය |
| දිනය | : | 2019. 02.21 |
| විෂයය | : | හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණ භූමි පරිශ්‍රයේ කාපට් ඇතිරීම සම්බන්ධ පරීක්ෂණ වාර්තාව. |

**අරමුණ :-** හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණ භූමි පරිශ්‍රයේ කාපට් ඇතිරීම සම්බන්ධව සිදුකල මූලික විමර්ෂණ වාර්තාව අනුව කලමණාකරු (ප්‍රසම්පාදන හා ආනයන) පී.එස්.කේ.ජයකොඩි මහතාට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ පරීක්ෂණ වාර්තාව සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් ලබාගැනීම.

**පසුබිම පැහැදිලි කිරීම :-** අප සමාගමේ හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණ භූමි පරිශ්‍රයේ කාපට් ඇතිරීම සම්බන්ධව සිදුකල මූලික විමර්ෂන වාර්තාවට අනුව කළමණාකරු (ප්‍රසම්පාදන හා ආනයන) ලෙස කටයුතු කල පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි මහතා රාජකාරි වැඩ තහනමට ලක්කර, ඔහු වෙත විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලදි.(ඇමුණුම 01)

ඉහතකී විධිමත් විනය පරීක්ෂණයේ පරීක්ෂණ නිලධාරි ලෙස කටයුතු කරන ලද ජේ.දික්මාදුගොඩ මහතා විසින් ඒක පුද්ගල විනිශ්චය සභාවේ නිර්දේශ ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර ඇත.

එම වාර්තාවට අනුව පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි මහතා වෙත ඉදිරිපත් කරන ලද චෝදනා පහෙන් (05) දෙකකට (02) වැරදිකරුවී ඇත.(ඇමුණුම 02)

එකී චෝදනාවන් ආයතන සංග්‍රහයේ IIකාණ්ඩයේ පළමු උපලේඛනයේ (8),(9) හා (16) යටතේ දැක්වෙන අතර, ආයතන සංග්‍රහයේ 24:1 අනුව එවැනි වරදක් සඳහා බරපතල දඩුවම් ලබාදිය හැකි බව නිරීක්ෂණය වන අතර, ලබාදිය හැකි දඩුවම පිළිබඳ විස්තර ආයතන සංග්‍රහයේ 24:3හි දක්වා ඇත.

තවද ඉහතකී වාර්තාවේ පිටු අංක 10 හා 11හි සඳහන්, මූලික විමර්ෂණ වාර්තාව සම්බන්ධයෙන් ඒක පුද්ගල විනිශ්චය සභාව විසින් දක්වා ඇති නිරීක්ෂණද අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය පිණිස යොමු කරමු.

**නිර්දේශය :-** ඉහත සම්බන්ධ කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් සඳහා කාරුණිකව ඉදිරිපත් කරමු.

සී.පී.ප්‍රේමතිලක මුලත්සිංහල,
වැඩ බලන කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්),
සීමාසහිත ලංකා පොහොර සමාගම.

පී.ආර්.සමරවීර ,
සාමාන්‍යාධිකාරී (වැඩ බලන),
සීමාසහිත ලංකා පොහොර සමාගම.

OIC
සභාපති,